# නබි රජාණන් ද සංදේශය රැගෙන ආ දාසයා ද?

[ සිංහල – Sinhala – سنهالي ]

අල් හාෆිස් ඉබ්නු රජබ් අල් හන්බලි

**"හුඃෂූ ෆිස් සලාත්"** නම් ග්‍රන්ථයේ අවසාන පරිච්ඡේදයෙන් උපුටා ගන්නා ලදී

සිංහල පරිවර්තනය

ජාසිම් ඉබ්න් දඉයාන්

2015 - 1436

IslamHouse.com

# هل محمد صلى الله عليه وسلم نبي ملك أو عبد رسول؟

« باللغة السنهالية »

الحافظ إبن رجب الحنبلي

ترجمة: **جاسم بن دعيان**

2015 - 1436

IslamHouse.com

# නබි රජාණන් ද සංදේශය රැගෙන ආ දාසයා ද?

## අල් හාෆිස් ඉබ්නු රජබ් අල් හන්බලි [1]

**"හුෂූ ෆිස් සලාත්"** නම් ග්‍රන්ථයේ අවසාන පරිච්ඡේදයෙන් උපුටා ගන්නා ලදී.

මුහම්මද් නබි (සල්) තුමාණන් රජ පදවිය ට වඩා උබූදිය්යා (අල්ලාහ් ගේ සේවක හා දාසත්වය) නම් ස්ථානය තෝරා ගත්හ. මක්කා නගරය ජය ගත් දින නබි (සල්) තුමාණන් ට දක්වන ගෞරවය නිසා තැති ගත් මිනිසෙක් දුටු මුහම්මද් (සල්) තුමාණන් "ඔබ කරදර නොවන්න. සැබැවින්ම මම රජ කෙනෙක් නොව, වියළුන ලද මස් ආහාරය ට ගන්නා කුරෙයිෂි කාන්තාවක ගේ පුතෙකු වෙමි." යැයි පවසා ඔහු ගේ සිතට සහනය දුන්නේය. (මූලාශ්‍ර ඉබ්නු මාජා 3312)

"මර්යම් (අලෛ) තුමිය ගේ පුත් ඊසා (අලෛ) තුමාණන් ව ක්‍රිස්තු බැතිමතුන් සීමාව ඉක්මවා ප්‍රශංසා කළ අයුරින් මා හට ප්‍රශංසා නොකරනු. සැබැවින් ම, මම අල්ලාහ් ගේ වහලෙක් වෙමි. එනිසා අල්ලාහ් ගේ වහලෙක් හා අල්ලාහ් ගේ සංදේශකවරයෙක් ලෙස

අමතන්න.” යනුවෙන් නබි (සල්) තුමාණන් උපදෙස් දුන්හ. උමර් ඉබ්නු අල් කත්තාබ් දන්වයි. මූලාශ්‍ර සහීහ් බුහාරි 6/345.

අබු Zසුරාහ් විසින් පවසනු ඇසූ බව මුහම්මද් ඉබ්නු ෆදෙයිල් දන්වා, ඉමාම් අහමද් (රහි) මෙම හදීස් වදන වාර්තා කරයි. “අබු හුරෙයිරා (රළි) මෙසේ දැන් වූ දැය හැර මම වෙන කිසිවක් නොදනිමි. ජිබ්රීල් තුමා නබි (සල්) තුමාණන් සමඟ වාඩි වී අහස දෙස ට නෙත් යොමු කළ විට මලාඉකා වරයෙක් දුටුවේය. ‘මෙම මලාඉකා වරයා මෙ දින ට පෙර කිසි විටෙක මෙලෙස පැමිණ නැත.’ යැයි ජිබ්රීල් (අලෙ) පැවසීය. මලාඉකාවරයා පහළ ට පැමිණ, ‘මුහම්මද් තුමණි! ඔබ ව නබි රජාණන් වශයෙන් (පත් කරන්න ද?) නැතහොත් වහල් සංදේශකවරයෙක් වශයෙන් පත් කරන්න දැයි (විමසනු පිණිස) පරමාධිපතියාණන් විසින් එවනු ලැබුවෙමි.’ යැයි පැවසීය. (මූලාශ්‍ර ඉමාම් අහමද් 2/321)

යහ්යා ඉබ්නු කතීර් (රහි) දැන් වූ මුර්සල් හදීස් වදනක, “වහලෙක් ආහාර ගන්නා සේ මම ආහාර ගනිමි. වහලෙක් වාඩි වී සිටිනා සේ වාඩි වෙමි. සැබැවින්ම, මම වහලෙක් වෙමි.” යැයි නබි (සල්) තුමාණන්

පැවසුහ. ඉබ්නු සඅද් අත් තබකාත් වාර්තා කරයි. ෂෙයික් අල්බානි ගේ සහීහ් අල් ජාමි අංක 8.

අයිෂා (රළි) තුමියගෙන් අල් මක් බූරි සවන් දුන් හදීසය අබූ මාදර් මෙසේ වාර්තා කරයි. මලාඉකා වරයෙක් මා වෙත පැමිණ, අල්ලාහ් ඔබ ට ආශිර්වාදය පවසා,‘ ඔබ කැමති වන්නේ නබි රජාණන් වීමට ද නැතහොත් වහල් සංදේශක වරයෙක් වීමට දැයි විමසයි.‘ යනුවෙන් දැන්විය. එවිට ජිබ්රීල් (අලෙ) තුමා මම යටත් පහත් විය යුතු බව මට ඉඟියක් කළ විට “වහල් නබිවරයෙක්” යැයි දැන්වූයෙමි යැයි නබි (සල්) තුමාණන් පැවසීය. එදින පටන් නබි (සල්) තුමාණන් ඇල වී සිටිමින් ආහාර නොගත් හ. “මම වහලෙක් ආහාර ගන්නා අයුරින් ආහාර ගනිමි. වහලෙක් වාඩි වී සිටිනවා මෙන් වාඩිවෙමි” යැයි නබි (සල්) තුමාණන් පැවසුහ. මූලාශ්‍ර ෂර්හ් අස් සුන්නාහ් ග්‍රන්ථයේ අල් බාගවි 4683)

මුර්සල් හදීස් වදනක් අZස් Zසුහ්රි (රහි) මෙසේ වාර්තා කරයි. “නබි (සල්) තුමාණන් වෙත මෙය ට පෙර නොපැමිණි මලාඉකාවරයෙක් පැමිණීය. එ සමඟ ජිබ්රීල් (අලෙ) තුමා ද පැමිණීය. ජිබ්රීල් (අලෙ) නිශ්හබ්දව සිටිය දී එම මලාඉකා වරයා කතා කර,

“ඔබ කැමති නබි රජාණන් ලෙස වීමට ද නැතහොත් වහල් නබිවරයෙකු ලෙස  සිටීමට ද ? යැයි ඔබේ පරමාධිපති විමසයි.” යනුවෙන් පැවසීය. එවිට නබි (සල්) තුමාණන් උපදෙස් පතන්නා සේ ජිබ්රීල් (අලෙ) දෙස බැලුවේය. එවිට ඔහු (නබි තුමාණන්) යටත් පහත් භාවයෙන් සිටිය යුතු බව ජිබ්රීල් (අලෙ) තුමා ඉඟි කළේය. එනිසා නබි (සල්) තුමාණන්, “වහල් නබිවරයෙක්” යනුවෙන් පිළිතුරු දුන්හ. එදින පටන් නබි (සල්) තුමාණන්, මෙලොව හැර යන තුරු ඇල වී සිටිමින් ආහාර නොගත්තේය‘ යනුවෙන් අZස් Zසුහ්රි (රහි) පවසයි. (මුලාශ්‍ර අල් බාගවි 3684)

නබි (සල්)  තුමාණන් මෙසේ පැවසූ බව අබූ හුරෙයිරා (රළි) වාර්තා කළේය. “බලය සහ තේජාවන්ත භාවය සහිත මාගේ පරමාධිපති මක්කා මීටියාවත රත්‍රන් වලින් පුරවා දීමට මගේ කැමැත්ත විමසුවේය. එහෙත් එය ට මම “මාගේ පරමිධිපතියාණනි! එය මට අවශ්‍ය නැත. කෙසේ වුවත්, එක් දිනකට ආහාර සපයා පසු දින මා කුසගින්නේ තබනු. මෙමගින් කුසගින්නේ සිටින විට, මම ඔබ ඉදිරියේ බැගෑපත් ව ඔබ ව සිහි කරමි. තවද, ආහාරයෙන් මගේ කුස පිරුණු විට මම ඔබට කෘතඥතාව දක්වමි” යැයි ප්‍රකාශ කළහ. මූලාශ්‍ර සුනන් අත් තිර්මිදි.

කවරෙකු හෝ තමා උබූදියියා (අල්ලාහ් ගේ වහල් භාවය) ට අයත් කෙනෙත් යැයි පවසන නමුත්, ඔහු තුළ තෘෂ්ණාව තවමත් තිබේ නම් ඔහු පවසන්නේ අසත්‍යය කි. උබූදිය්යා තත්ත්වය ලැබීම සත්‍යය වන්නේ කෙනෙක් තම තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම මැඩ පවත්වා ගෙන, තම පරමාධිපති ගේ කැමැත්ත තමා තුළ ස්ථාපිත කර ගන්නා විටය. එවිට ඔහු ඉබාදුර් රහ්මාන් (අති කරුණා හරිතයාණන් ගේ දාසයා) යන නාමය සැබැවින් ම උරුම කර ගනු ඇත.

අස්මා උස් සබාබාහ් නම් ග්‍රන්ථයේ, අල් හාෆිද් අබූ නුඅයිම් (රහි) පවසන්නේ මෙසේය. අල්කාමා ඉබ්නුල් හාරිත් අල් අස්දී තම සීයා ගෙන් ඉගෙන ගත් ඔහු ගේ පියා, ප්‍රඥාවන්ත ලුක්මාන් තම පුත්‍රයා ට උපදෙස් දුන් වදන් මෙසේ පැවසුවේය. “මගේ ප්‍රඥාවන් සියල්ල ඔබ සඳහා වාක්‍යයන් සයක ට රැස් කර දෙමි. ඒවා නම්, මිහිතලයේ ඔබ කෙතරම් කාලයක් සිටින්නේ ද, ඒ කාලය සඳහා කටයුතු කරනු. එමෙන්ම මරණයෙන් පසුව ඔබ කෙතරම් කාලයක් සිටින්නේ ද, ඒ කාලය ට සමාන ව කටයුතු කරනු. ඔබට විඳ දරා ගත හැකි ප්‍රමාණය ට සමාන ව පාපයන් හි නිරත වනු. අල්ලාහ්ගෙන් ඔබ ගේ අවශ්‍යතාව කොපමණ ද, එයට සමාන ප්‍රමාණය ට අල්ලාහ් සඳහා ක්‍රියා කරනු. ඔබට

විඳ දරා ගත හැකි දඬුවම් ප්‍රමාණය ට සමාන ව අල්ලාහ් ට අකීකරු ව කටයුතු කරනු. කිසිවෙකුගෙන් කිසිවක් අවශ්‍ය නොමැති කෙනෙකුගෙන් හැර අන් කිසිවෙකුගෙන් කිසිවක් ඉල්ලීම් නොකරනු. අල්ලාහ් ට එරෙහි ව පාප කර්මයක් සිදු කරන්න ට ඔබ සූදානම් වන්නේ නම්, අල්ලාහ් ට නොපෙනෙන ස්ථානයක එය ඉටු කරනු.''

ඉබ්‍රාහීම් අල් හෑව්වාස් (රහි) මෙසේ පැවසුවේය. ''හදවතට සුවය ලබා දෙන කරුණු හයක් තිබේ. ඒවා නම්, අල් කුර්ආනය පාරායන කිරීමේ දී එහි වදන් පිළිබඳ ව ආවර්ජනය කිරීම, සහ මෙනෙහි කිරීම, (අධික ලෙස උපවාසයේ යෙදීමෙන්) කුසය හිස් ව තබා ගැනීම, රාත්‍රි නැමදුමෙ හි යෙදීම, අලුයම වේලාවේ යටත් පහත් භාවයෙන් නැමදුම කිරිම සහ ධර්මිෂ්ඨ ජනතාව සමඟ නිතර ඇසුරු කිරීම.''

හිජ්රි 162 වසර ජීවත් වූ ඉබ්‍රාහිම් ඉබ්නු අදහම් (රහි) නම් ආගමික විද්වතෙක් බස්රා නුවර වෙළෙඳ පොළ පසු කර ගෙන යන විට, එතුමා වටා රොක් වූ නගර වැසියන් මෙසේ ප්‍රශ්න කළහ.

''අබූ ඉස්හාක් තුමනි! ''මා ගෙන් ඉල්ලා සිටිනු. මම නුඹලා ගේ ඉල්ලීම ට පිළිතුරු දෙන්නෙමි.'' යැයි

උත්තරීතර අල්ලාහ් කුර්ආනයේ සූරා ගාෆිර් 40:60 වාක්‍ය මගින් ප්‍රකාශ කරයි. අපි අල්ලාහ්ගෙන් දිගු කලක් දුආ ප්‍රාර්ථන කරමින් සිටින නමුත්, අල්ලාහ් අපගේ ප්‍රාර්ථනාවන් ට පිළිතුරු නොදෙන්නේ කුමක් නිසා ද? ”

එම ප්‍රශ්නය ට එතුමා මෙසේ පිළිතුරු දුන්නේය.

බස්රා නගර වැසියනි! කරුණු දහයක් පිළිබඳ ව ඔබ සැම ගේ හදවත් මරණය ට ලක් ව අවසානය.

1. අල්ලාහ් ගැන ඔබ සැම දන්නා නමුත් ඔබ ඔහු ට කීකරු නොවන්නේ ය.

2. අල්ලාහ් ගේ ග්‍රන්ථය ඔබ සැම කියවන නමුත් ඒ ආකාරයෙන් ක්‍රියා නොකරන්නේ ය.

3. ඔබ සැම ෂෙයිතාන් සතුරෙක් බව ට ප්‍රකාශ කරන නමුත්, ඔහු ගේ මාර්ගය ට එකඟ ව ක්‍රියා කරන්නේය.

4. අල්ලාහ් ගේ සංදේශකවරයා කෙරෙහි ආදරය දක්වන බව ඔබ සැම පවසන නමුත්, එතුමාණන් ගේ සුන්නාහ් ව අත හැර දමන්නේ ය.

5.  ඔබ සැම ස්වර්ගය ට අධික ව ආශා කරන බව පවසන නමුත්, එය ට පිවිසීම සඳහා කිසිවක් නොකරන්නේ ය.

6. අපාය ගින්න ට බිය වන බව ඔබ සැම පවසන නමුත්, ඔබ පාපයන් හි නිරත වී මෙන් ඉවත් නොවන්නේ ය.

7.  ඔබ සැම මරණය සත්‍ය බව පවසන නමුත් එය සඳහා ඔබ කිසිවක්  සූදානම් නොකරන්නේ ය.

8. අනුන් ගේ වැරදි සෙවීම ට කාලය වැය කරන ඔබ සැම, ඔබේ ම වැරදි ගැන සැලකිලි නොදක්වන්නේ ය.

9. ඔබේ පරමාධිපති ගේ ආශිර්වාද ඔබ සැම භුක්ති විඳින නමුත් ඒවා සඳහා කළ ගුණ නොදක්වන්නේ ය .

10.  භූමියෙහි, ඔබේ මළවුන් වළ දමන නමුත්, එයින් ඔබ කිසිවෙක් පාඩම් නොලබන්නේ ය.

අල්ලාහ් ගේ සතුට ලබා ගැනීම ට අපට හැකියාව දෙන ලෙස ද අප වෙත ඔහු ගේ කරුණා ව පහළ කරන ලෙස ද අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කරමු.

කෙටි සටහන්

1. ඉබ්න් රජබ් අල් හන්බලි යනුවෙන් හැඳින් වන මෙතුමා, ඉමාම් වරයෙක්, හැෆිද් වරයෙක්, Zසාහිද් (නම් තාපස) වරයෙක්, අවවාද කරන්නෙක් වේ. අබුල් ෆරාජ් අබ්දුර් රහ්මාන් ඉබ්නු අහමද් රජබ් අස් සලාමි නමැති මෙතුමා කෙටියෙන් ඉබ්න් රජබ් අල් හන්බලි යනුවේ හඳුන්වන ලදි. මෙතුමා පිලිබඳව ඉබ්න් ෆහද් මෙසේ කීහ. "මෙතුමා ඉමාම්වරයෙකි, හාෆිද් වරයෙකි, හුජ්ජා (සාධකයෙකි) දැනුම ලත් විද්වතෙකි, නොවරදින කෙනෙකි." මෙලොව ආශාවන් ගෙන් වැළකී සිටි ආගමික විද්වතුන් අතර කෙනෙකු වන මෙතුමා ඉමාම්වරු සහ නැමදුම් කරන්නන් අතර කෙනෙකි. හදීස් වදන් පිළිබඳ මහ පෙන්වූ ගුරුවරයෙකු වූ මෙ තුමාගෙන් විවිධ සම්ප්‍රදායන් ට අයත් මුස්ලිම්වරු උපදෙස් ලැබ, තම හදවත් විවෘත කර ගත්හ. මෙතුමා ගැන අස් සුයූති මෙසේ පවසයි. "අබ්දුර් රහ්මාන් නමැති මෙතුමා ඉමාම් වරයෙකි, හාෆිද් වරයෙකි, හදීස් සම්බන්ධ පඬිවරයෙකි, අවවාද කරන්නෙකි." ඉමාම් රජබ් තුමා, එවක ට ජිවත් වූ ඉබ්නුල් ඛය්යිම් අල් ජව්Zසිය්යා, අල් හාෆිද් අල් ඉරාකි, ඉබ්නුන් නකීබ් සහ තවත් වැදගත් පඬිවරුන්ගෙන් අධ්‍යාපනය ලැබුවේය. මෙම ඉමාම්වරයා තෆ්සීර් නම් අල් කුර්ආන් විග්‍රහය, හදීස්, ජිවිත චරිත සහ ඉතිහාසය, රකායික් නම් හැඟීම් පිළිබඳ කරුණු සහ ෆික්හ් නම් නීති සම්බන්ධව

බොහෝ ග්‍රන්ථ රචනා කළේය. හන්බලි මද්හබ ට අදාල ෆික්හ් පහදා දෙන “අල් කවාඉදුල්-කුබ්රා ෆිල් ෆුරූ” නම් සුප්‍රසිද්ධ ග්‍රන්ථය ද මෙතුමා රචනා කළේය.

නිමි.

ඔබ  ගේ අගනා අදහස් අප ට දනවන්න.

www.sinhala@islamhouse.com